මගේ අංකය : 16/03/02
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
මහකනදරාව ව්‍යාපාරය
රඹෑව.
2019/12/17
ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

විශේෂ ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීම් වාර්තාව
2019 දෙසැම්බර් මාසය - මහකනදරාව ව්‍යාපාරය

දිනය -2019/12/05
වේලාව -පෙ.ව. 9.30
ස්ථානය - මහකනදරාව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

සහභාගි වූ රජයේ නිලධාරීන්

| අනු අංක | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | අයි.ඩී.එන්.අයි.පතිරණ මිය | නේවාසික ව්‍යාපාරකළමනාකරු | මහකනදරාව ව්‍යාපාරය |
| 02 | බී.ටි මහආරච්චි මයා | ඉංජිනේරු සහකාර | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය අනුරාධපුර |
| 03 | කේ.එම්.කේ.එච්.එන්.කැටිමින්ගම මිය | ඉංජිනේරු සහකාර | ප්‍රාදේශීයවාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය අනුරාධපුර |
| 04 | පී.ඩබ්.ඩී.ආර්.ජයතිලක මිය | සංවර්ධන නිලධාරි | මහකනදරාව ව්‍යාපාරය |
| 05 | කේ.පී.එස්.කුමාරි මිය | සංවර්ධන නිලධාරි | මහකනදරාව ව්‍යාපාරය |
| 06 | ඩී. පී සුමිත් හල්ලල මයා | අභ්‍යාසලාභී උපාධිධාරී | මහකනදරාව ව්‍යාපාරය |
| 07 | ඒ.ජී.එස් සුභාෂිණී මිය | මූලස්ථාන කෘෂිකර්ම උපදේශ | කෘෂිකර්ම උපදේශක කාර්යාලය -රඹෑව |
| 08 | ජී.ඒ.එස් පෙරේරා මිය | ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී | ගොවිජන සේවා මධ්‍යස්ථානය-රඹෑව |
| 09 | එස්.එන් බී.එම්. සී.පී. සේනානායක මයා | සත්ව සංවර්ධන උපදේශක | පශු වෛද්‍ය කාර්යාලය- රඹෑව |
| 10 | එස්.එස් සී ඩී කුමාරි මිය | සත්ව සංවර්ධන උපදේශක | පශු වෛද්‍ය කාර්යාලය- රඹෑව |
| 11 | නිරංජන් සිල්වා මයා | සත්ව සංවර්ධන උපදේශක | පශු වෛද්‍ය කාර්යාලය - මිහින්තලය |
| 12 | සී.එම් රත්මැණිකේ මිය | ජනපද නිලධාරී | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මිහින්තලය |
| 13 | කේ.ජී.ආර් කේ. විතානගේ මිය | ජනපද නිලධාරී | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රඹෑව |
| 14 | එස්.බී.ඩබ්.අර්ජුන ලලිත කුමාර මයා | තාක්ෂණ සහායක | වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය අනුරාධපුර |
| 15 | සී.එම්.ඩී.එස් වීරසිංහ මයා | තාක්ෂණ සහායක | වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය අනුරාධපුර |

සහභාගී වු ගොවි නියෝජිතයින්

| අනු අංක | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | ආර්. එම්. ආර්. රාජපක්ෂ මයා | ගරු සභාපති | ව.ඉ සුහද ගොවි සංවිධානය |
| 02 | ඩී.ජී. සිරිල් ගමගේ මයා | ගරු ලේකම් | ව.ඉ එකමුතු ගොවිසංවිධානය |
| 03 | ජේ.එම්.පී චන්දන මයා | ගරු සභාපති | ද.ඉ.පැරකුම්යාය 02 ගොවි සංවිධානය |
| 04 | එම් කුමාරසිංහ මයා | ගරු සභාපති | ද.ඉ රණමයුර ගොවිසංවිධානය |

| | | | |
|---|---|---|---|
| 05 | එස්.එම් ඩිංගිරිබංඩා මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉ රණමයුර ගොවි සංවිධානය |
| 06 | ජී.ධර්මපාල මයා | ගරු ලේකම් | ව.ඉ එක්සිත් ගොවි සංවිධානය |
| 07 | එම්. දයාවතී මිය | ගරු සභාපති | ව.ඉ එක්සිත් ගොවි සංවිධානය |
| 08 | අයි කුමාර ජයලත් | ගරු සභාපති | ව.ඉමහසෙන් ගොවි සංවිධානය |
| 09 | කේ.කේ.අත්තරගම මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉමහසෙන් ගොවි සංවිධානය |
| 10 | එස්.ඩී සුනිල් මයා | ගරු ලේකම් | ද.ඉ.පැරකුම්යාය 05 ගොවි සංවිධානය |
| 11 | ජේ. එස්. දිසානායක මයා | ගරු සභාපති | ද.ඉ.පැරකුම්යාය 05 ගොවි සංවිධානය |
| 12 | එස්.ආරියරත්න මයා | ගරු ලේකම් | ද.ඉ. වේළුසුමන ගොවි සංවිධානය |
| 13 | එස්.එම්.කේ.බී සමරකෝන් මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. මිහිඳු ගොවි සංවිධානය |
| 14 | එච් කීර්තිපාල මයා | ගරු ලේකම් | ව.ඉ රඹෑවගම ගොවිසංවිධානය |
| 15 | කේ.එම්.ආර් චන්දන බංඩාර මයා | ගරු ලේකම් | ද.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 16 | සුභසිංහ රත්නායක මයා | ගරු සභාපති | ව.ඉ රණමයුර ගොවි සංවිධානය |
| 17 | ඒ.එම් විජේතුංග මයා | ගරු සභාපති | ව.ඉ. මිහිඳු ගොවි සංවිධානය |
| 17 | අයි.එම් ජයතිස්ස මයා | ගරු සභාපති | ද.ඉ.සුභද ගොවි සංවිධානය |
| 18 | යූ.බී. සෙනවිරත්න මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. වේළුසුමන ගොවි සංවිධානය |
| 19 | එච් විජේසිරි මයා | ගරු සභාපති | ද.ඉ. සමගි ගොවි සංවිධානය |
| 20 | එම්.වී.එල් නවරත්න මයා | ගරු ලේකම් | ව.ඉ සුභද ගොවි සංවිධානය |
| 21 | එස්.එස් තුසිත ආනන්ද මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 22 | කේ.එම් සලීම් මයා | ගරු උප සභාපති | ද.ඉ ෂම් ෂම් ගොවිසංවිධානය |
| 23 | ඩබ්.ඩී.එල්.ගුණසේකර මයා | ජල පාලක | ව.ඉ මහසෙන් ගොවිසංවිධානය |

ආගම සිහි කිරිමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමිය විසින් පැමිණ සිටි සියලු දෙනා පිළිගත් අතර රැස්වීමේ න්‍යාය පත්‍රය සභාගත කරන ලදී.

1.පසුගිය රැස්වීම් වාර්තාව සමාලෝචනය හා එකඟතාවය ලබා ගැනීම.

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් ද.ඉ රණමයුර ගොවිසංවිධානයේ ගරු සභාපති මහතාගේ හා ව.ඉ එක්සිත් ගොවිසංවිධානයේ ගරු ලේකම් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් එම වාර්තාව සභා සම්මත විය.

2.ලිපි ඉදිරිපත් කිරිම.

| අනු අංකය | ඉදිරිපත් කළ අය/ ආයතනය | කාරණය | වෙනත් |
|---|---|---|---|
| 2.1 | ප්‍රාදේශීය ලේකම් රඹෑව | අපේක්ෂිත මෝසම් වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක්වන පිරිස වෙනුවෙන් ආපදා සහනසේවා සඳහා සූදානම් කරවීම පිළිබඳව දැනුම් දීම. | ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. |

03. ආයතන සංවර්ධන කටයුතු :- ඉදිරිපත් කිරීම සංවර්ධන නිලධාරි -පී.ඩබ්.ඩී.ආර්.ජයතිලක මිය

2019 නොවැම්බර් මස ප්‍රගතිය

| අනු අංකය | කාරණය | ප්‍රගතිය | වෙනත් |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 3.1.1 | මාසික මුදල් සාරාංශ කාර්යාලයට ලැබීම ( 2019/12/05 දිනට) | 03 | ව.ඉ.මිහිදු , ව.ඉ එකමුතු ,ව.ඉ රණමයුර යන ගොවි සංවිධාන ලබා දී ඇත. |
| 3.1.2 | මාසික කාරක සභා රැස්වීම් පැවැත්වීම | 12 | ද.ඉ පැරකුම් යාය 02,ද.ඉ වේළුසුමන,ද.ඉ සුහද ගොවි සංවිධාන හැර අනෙකුත් ගොවි සංවිධාන කාරක සභා රැස්වීම් පවත්වා ඇත. |

3.1.3 පරිසර හිතකාමී ශාඛ ව්‍යාප්ත කිරීම

ජාතියේ පොහොර ගස ලෙස මී ගස ජනගත කිරිමේ වැඩසටහනට සහභාගී වු ගොවිසංවිධාන වෙත ලබා දීමට මී පැළ 400ක් උතුරු මැද පළාත් අමාත්‍යාංශයෙන් ලැබුණු අතර පහත පරිදි එම මී පැළ බෙදා දුන් බවත්

ව.ඉ සුහද - 250,ව.ඉ මහසෙන් - 25,ද.ඉ සුහද - 75,ද.ඉ පැරකුම් යාය 02 – 50

නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමිය පැහැදිලි කළ අතර මේ වන විට මී පැළ සිටුවීමේ ප්‍රගතිය පිළිබඳ විමසන ලදී.

ද.ඉ පැරකුම් යාය2 ගොවිසංවිධානයට ලබා දුන් මී පැළ 50න් 30ක් මේ වන විට සිටුවා අවසන් බව එම ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා පැවසු අතර ව.ඉ මහසෙන් ගොවිසංවිධානයේ ගරු සභාපති මහතා කියා සිටියේ වර්ෂාව නිසා සිටුවීමට නොහැකි වු බවත් වර්ෂාව නතර වු පසු සිටුවීමට කටයුතු යොදා ඇති බවයි ව.ඉ සුහද ගොවිසංවිධානයට ලබා දුන් මී පැළ 250 අළුත් වැව රක්ෂිතයේ සිටුවීමට සැලසුම් කළත් පොරොන්දු වු පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගොඩ ඉඩම් කොටසේ රක්ෂිත සීමාව පෙන්වා නොදුන් නිසා සිටුවීමට ප්‍රමාද වන බව එම ගොවිසංවිධානයේ ගරු සභාපති මහතා පවසන ලදී. මේ පිළිබඳව ජනපද නිලධාරි විතානගේ මහත්මියගේ අවධානයට යොමු කළ අතර ඉදිරි සතිය තුල අදාල රක්ෂිත සීමාව පෙන්වා දීමට එහිදී එකඟතාවය පළ කරන ලදී.

3.2 PEISEIP ව්‍යාපෘතිය

2020 වර්ෂය තුල PEISEIP ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් ද.ඉ ෂම් ෂම්/ ද.ඉ වේළුසුමන /ද.ඉ මහසෙන්/ව.ඉ රණමයුර හා ව.ඉ එකමුතු යන ගොවි සංවිධාන 06හි ගොවි සංවිධාන මට්ටමින් මහ සභා රැස්වීම් පවත්වා තම තමන්ගේ ගොවි සංවිධාන වල PEISEIP ව්‍යාපෘතිය සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කල යුතු ඇල තෝරාගෙන ඊලඟ ව්‍යාපාර කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙසට නේවාසික ව්‍යාපාර කළමනාකාර තුමිය විසින් දැනුම් දුන් අතර වාරිමාර්ග කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ සමඟ ව.ඉ එක්සිත් සහ ද.ඉ පැරකුම් යාය 05 ගොවිසංවිධාන අත්සන් කරන ලද කොන්ත්‍රාක් ගිවිසුම් ප්‍රකාරව එම ගොවි සංවිධාන 02 විසින් මේ වන විට දැන්වීම් පුවරු සවි කිරිමේ උප ව්‍යාපෘතිය සිදු කර අවසන් බවත් ඒ අනුව පහත පරිදි එම පුවරු සිටුවා ඇති බවත්

| ගොවි සංවිධානය | ඇල අංකය | ගොවි සංවිධානය | ඇල අංකය |
|---|---|---|---|
| ව.ඉ එක්සිත් | OT 24A<br>OT25<br>OT 25 G2<br>OT 25 G4<br>OT 26<br>OT 27 | ද.ඉ පැරකුම් යාය 05 | OT 24<br>OT 24 G2<br>OT 24 G3<br>OT 25 G1<br>OT 25 G2 |

ක්‍රියාවලි විගනන කමිටු රැස්වීම සෑම වර්ෂයකම මැද සහ අග පැවැත්විය යුතු බවත් ක්‍රියාවලි විගනන කමිටු රජයේ නිලධාරි සාමාජිකයෙක් වු සුසිල් අමරසිරි මහතා දැනට ගලෙන්බිදුණු වැව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වැඩ බලන බැවින් ඒ මහතා සම්බන්ධ කර ගැනීමේ අපහසුතාවයක් පවතින බැවින් ඒ වෙනුවට වෙනත් අයෙකු පත් කර ගැනීම සුදුසු බවද පැහැදිලි කරන ලදී.

එහිදී වම් ඉවුර සුහද ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා කථාකරමින් ක්‍රියාවලි විගනන කමිටුවේ කමිටු සාමාජික ලෙස රඹෑව ගොවිජන සේවා මධස්ථානයේ ජී.ඒ.අයේෂා පෙරේරා මහත්මිය සුදුසු යැයි යෝජනා කල අතර ව.ඉ එක්සිත් ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

4 වාරිමාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු - ඉංජිනේරු සහකාර - බී.ටී මහආරච්චි මහතා

4.1 මහකනදරාව ජලාශයේ අද දිනට ජල මට්ටම අඩි 15ක් (ජල ධාරිතාවය අක්.අඩි 22250) බවත්

4.2 ඇදහැලෙමින් පවතින වර්ෂාව නිසා මහකනදරාව ජලාශයට ඉහල ධාරා පෙදෙසේ වැව් වාන් මට්ටමේ පවතින නිසා ජලාශයේ දැනට පවතින ජල තත්වය අනුව වාන් මට්ටමට ලගා විය හැකි බවත් වැවේ ජලය නොගෙන වර්ෂා ජලයෙන් බිම් සැකසීම සුදුසු බවත් පැහැදිලි කරන ලදී.

4.3 මෙහෙයුම් හා නඩත්තු කටයුතු

ගොවි සංවිධානවල ඇල මාර්ගවල දොරටු සඳහා මේ වන විට මල නොබැදෙන සුදු යකඩ දොරවල් 06ක් සකසා ඇති බවත් ඒවා කඩිනමින් සවි කරන බවත් ද.ඉ ඉකිරිගොල්ලෑවOT17 ඇල G 06 රෙගියුලේටරයේ තිබූ ගැටළු විසඳූ බවත්

4.4 දියවරනෑයෝ වැඩසටහන යටතේ යන්ත්‍ර සූත්‍ර ලබාදිය හැකි සියළුම ගොවි සංවිධාන වලට යන්ත්‍ර සූත්‍ර ලබා දුන් බවත්

ද.ඉ මහසෙන්G 06,G 08 ද.ඉ පැරකුම්යාය02 OT8 OT7 OT9 ද.ඉ ෂම් ෂම් OT14 G11,G12, ද.ඉ රණමයුර OT19 OT20G2-2 ඇලවල් සඳහාත් ද.ඉ වේළුසුමන කුණු ඇලවල් හෑරීම, ද.ඉ සමගි සියළුම කෙත් ඇලවල්වල රොන්මඩ හා ඇල දෙපස ගස් ඉවත් කිරීම සඳහා යන්ත්‍ර ලබා දුන් බවත්

ව.ඉ එකමුතු OT4 කුණු ඇල හෑරීම ව.ඉ රණමයර OT5, OT6,OT7 කෘෂි මාර්ග වලට බොරළු දැමීම ව.ඉ මිහිදුOT8, OT9, OT10 කෘෂිමාර්ග වලට හැකි අයුරින් බොරළු දැමීම හා OT8,OT10 ඇලේ රොන්මඩ ඉවත් කිරීම, කුණු ඇලවල් හෑරීම.ව.ඉ මහසෙන් රඹෑව වැව යටතේ Long arm එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා රඹෑව වැව ශුද්ධ පවිත්‍ර කිරීම වැනි විශාල වැඩ කටයුතු ප්‍රමාණයක් දියවර නෑයෝ වැඩසටහන යටතේ මේ වන විට සිදු කොට ඇති පැවසු අතර ගොවි සංවිධාන මට්ටමින් කුඹුරු බට සහ ගේට්ටු ලබා දීමට අවශ්‍ය ලැයිස්තු ලබා දෙන ලෙස දැනුවත් කලත් මේ වන විට එම ලැයිස්තු නිසි පරිදි ලැබී නොමැති බවත් එම ඉල්ලීම් ලබා නොදුන් ගොවිසංවිධාන කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙසට දැනුවත් කරන ලදී.

4.5 දියවර නෑයෝ වැඩසටහන පිළිබඳව ගොවිසංවිධාන නිලධාරීන් ඉදිරිපත් කළ අදහස් හා යෝජනා

| අනු අංකය | ඉදිරිපත් කළ අය | අදහස්/යෝජනාව |
|---|---|---|
| 4.5.1 | ගරු සභාපති<br>ව.ඉ මිහිදු ගොවිසංවිධානය | ව.ඉ මිහිදු ගොවිසංවිධාන බල ප්‍රදේශයේ වසර 55කට පමන පසු විශාල වැඩකොටසක් දියවර නෑයෝ වැඩසටහන යටතේ සිදු කරගත් බවත් ඒ පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ස්තුතිය පළ කරන ලදී. |
| 4.5.2 | ගරු සභාපති<br>ද.ඉ පරකුම් යාය02 ගොවිසංවිධානය | OT7,OT8 හා OT9 කෘෂිපාරවල් සඳහා දියවර නෑයෝ වැඩසටහන යටතේ පස් දමා ගත්තද තුනී කර ගැනීමට වැස්ස නිසා නොහැකි වු බවත් වර්ෂාව නතර වුවීට ඒ සඳහා යන්ත්‍ර නැවත ලබා දෙන ලෙසට ඉල්ලීමක් කළ අතර ඉංජිනේරු සහකාර මහතා ඒ පිළිබඳව එකගතාවය පළ කරන ලදී. |
| 4.5.3 | ගරු සභාපති<br>ද.ඉ සුහද ගොවිසංවිධානය | තම ගොවි සංවිධාන බල ප්‍රදේශයේ වසර 40කින් පමණ නොවිසඳී තිබුණු නඩත්තු ගැටළු විශාල ප්‍රමාණයක් දියවර නෑයෝ වැඩසටහන යටතේ විසඳා ගත් බවත් ඒ පිළිබඳව ස්තුතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පුද කළ අතර තවත් වැඩ කොටසක් ඉතිරිව තිබෙන බැවින් ඒ සඳහා අළුත්වැඩියාවෙන් පසු යන්ත්‍ර ලබා දෙන ලෙසට ඉල්ලීමක් කළ අතර ඉංජිනේරු සහකාර මහතා |

| | | |
|---|---|---|
| | | එකඟතාවය පළ කරන ලදී. |
| 4.5.4 | ගරු සභාපති<br>ව.ඉ රණමයුර ගොවිසංවිධානය | දියවර නැයෝ වැඩසටහන යටතේ සැලකිය යුතු වැඩ කොටසක් සිදු කර ගත් බවත් වර්ෂාව නිසා OT5 OT7 අපවහන ඇලවල් කපා ගැනීමට නොහැකි වු බවත් OT7 ඇලේ පහලට කෘෂි වාහන ගැනීමට නොහැකි නිසා තාවකාලික වැඩ පිළිවෙලක් සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කළ අතර OT5 ඇලේ කුණු ඇලවල් කපා ගැනීම සඳහාද යන්ත්‍ර ලබා දෙන ලෙස ඉල්ලීම |
| 4.5.5 | ගරු සභාපති<br>ව.ඉ මහසෙන් ගොවිසංවිධානය | දියවර නැයෝ වැඩසටහන යටතේ තම ගොවි සංවිධාන බල ප්‍රදේශයේ නඩත්තු කටයුතු සිදු කර ගැනීමට යන්ත්‍ර නොලැබුණු බව පැවසූ අතර රඹෑව වැවේ රොන්මඩ ඉවත් කිරීම පිළිබඳව ස්තූතිය පළ කරන ලදී. |
| 4.5.7 | ගරු සභාපති දකුණු ඉවුර පැරකුම්යාය05 ගොවි සංවිධානය | OT25G1,G2 ඇලවල් අබලන් බවත්. ඒවා සකස් කර ගැනීමට මෙතෙක් යන්ත්‍ර නොලැබුනු බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසට ඉල්ලීමක් කළ අතර OT23 ඇලට පසුව OT 25ට යන්ත්‍ර ලබා දීමට සැලසුම් කර තිබු බවත් කැඩුණ යන්ත්‍රය අළුත්වැඩියා කල පසු ලබා දිය හැකි බව ඉංජිනේරු සහකාර මහතා පවසන ලදී |

4.6 PEISEIP ව්‍යාපෘතිය

PEISEIP ව්‍යාපෘතිය යටතේ OT22 කොන්ක්‍රීට් වැඩ අවසන් කර ඇති බවත් OT20 ඇලේ 75% පමණ වැඩ අවසන් කර ඇති බවත් OT16 වැඩ ආරම්භ කර ඇති බවත් පවසන ලදී.

ව.ඉ එක්සිත් ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා කථා කරමින් PEISEIP ව්‍යාපෘතිය යටතේ OT25 G1 මුදල් ලැබෙන තුරු ගොවි සංවිධානයෙන් ඉදිකිරීම් කටයුතු සිදු කර ගැනීමට හැකි බව පවසන ලදී.

ද.ඉ සමගි ගොවිසංවිධානයේ ගරු සභාපති මහතා කථා කරමින් OT 22 ඇල මාර්ගයේ ඉදිකිරීම් කටයුතු වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉතාමත් ප්‍රමිතියෙන් යුක්තව කෙටි කාලයක් තුල අවසන් කර දීම පිළිබඳව ස්තූතිය පළ කරන ලදී.

4.7 ගොවි සංවිධාන මට්ටමින් ඉදිරිපත් කල වාරි පද්ධතියේ ගැටලු

| අනු අංකය | ඉදිරිපත් කළ අය | කාරණය | විසඳුම/ තීරණය |
|---|---|---|---|
| 4.7.1 | ගරු සභාපති<br>වම්ඉවුර මිහිඳු ගොවි සංවිධානය | රඹෑව පන්සල පිටුපස වාන් ඇලේවතුර බහින්නේ නැති නිසා ශුද්ධ කර ගැනීම අවශ්‍ය බවත් වාරිමාර්ග දෙපාර්තමෙන්තුවෙන් ඇස්තමේන්තු සකසා දෙන්නේ නම් එය කළ හැකි බව ප්‍රාදේශීය සභාව දන්වා ඇති බව<br><br>මහකනදරාව ව්‍යාපාරයේ ගැටළු පවතින ඇලවල්වල ස්වභාවය අනුව රක්ෂිතය වෙන් කර දෙන ලෙස | පිට ආයතන සඳහා ඇස්තමේන්තු ලබා දීම තිබෙන වැඩ සමඟ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අපහසු බව ඉංජිනේරු සහකාර මහතා පැහැදිලි කරන ලදී.<br><br>වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලදී. |
| 4.7.2 | ගරු ලේකම් වම් ඉවුර එකමුතු ගොවි සංවිධානය | OT1 සහ OT2 සොරොව් දෙක සකස් කර දෙන ලෙස | පොලොවේ ලෙවල් එකට පවතින නිසා නිවැරදිව සකස් කර දෙන ලෙස පානීය ජල ව්‍යපෘතියට දැනුම් දුන් බව ඉංජිනේරු සහකාර මහතා පවසන ලදී. |

| | | | |
|---|---|---|---|
| 4.7.3 | ගරු සභාපති වම් ඉවුර මහසෙන් ගොවි සංවිධානය | G5,G6,G9 දොරවල් සකස් කර දෙන ලෙස ඉල්ලීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලදී. |
| 4.7.4 | ගරු ලේකම් වම් ඉවුර එක්සිත් ගොවි සංවිධානය | වර්ෂාව නිසා රත්මලේ වැවේ වැව් බැම්මට උඩින් ජලය ගලා යන නිසා ප්‍රධාන ඇලේ බැම්ම ඉදිකර දෙන ලෙස | මේ වන විට වාරිමාර්ග දෙපාර්ත මේන්තු යන්ත්‍ර ගං වතුර තිබෙන තැන්වලට යවා ඇති බවත් මේ සඳහා එක්ස් කැවේටරයක් අවශ්‍ය බවත් ඉංජිනේරු සහකාර මහතා පවසන ලදී. |
| 4.7.5 | ගරු සභාපති වම් ඉවුර සුහද ගොවි සංවිධානය | ප්‍රධාන ඇලේOT12,OT13 අතරත්OT14 මහ වැව වාන් දැමීම නිසා ගොඩවී ඇති බවත් එම නිසා ඇල පද්ධතියට හානී වී ඇති බවත්OT11හා OT14මහ වැව වාන් දැමීම නිසා ගොඩවී ඇති බවත්<br><br>OT 16,OT18,OT20,OT22, ප්‍රධාන ඇල හරහා කොන්ක්‍රීට් බැම්මක් තිබු බවත්<br><br>යන්ත්‍ර දමා ශුද්ධ කිරීමේදී කැඩී ඇති බැවින් එය සකස් කර ගත යුතු බවත් ව.ඉ සුහද ගොවිසංවිධානයේ අපවහන ඇල ශුද්ධ කිරීම අවශ්‍ය බවත් සියළුම ගොවි සංවිධානවල අපවහන ඇලවල් සකස් කිරීම සඳහා යන්ත්‍ර 02ක්වත් ලබා දෙන ලෙස<br><br>දියවර නැයේ වැඩසටහන යටතේ වාරිමාර්ග දෙපාර්තමෙන්තුව මගින් අළුත් වැවේ රක්ෂිත සීමා වෙන් කලත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහයෝගය ලබා නොදීම පිළිබඳ කනගාටු වන බවත්<br>ප්‍රධාන ඇල සහ පාර දෙපැත්තේ රක්ෂිතය වෙන් නොකළ පෙදෙසේ රක්ෂිතය වෙන් කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමෙන්තුවෙන් සහයෝගය ලබා දෙන ලෙසත් මල නොබැදෙන සුදු යකඩ දොරවල් ව්‍යාපාරයේ සියළුම ඇලවල් සඳහා ඉදිරියේදී සකස් කර දෙන ලෙසත්<br><br>මිහින්තලය ප්‍රාදේශීය සභාවෙන්<br>අශෝකපුරට කුණු නොදැමීම අද වන විට විශාල ගැටළුවක් වී ඇති බවත් ඒ සඳහා | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලදී.<br><br>ජනපද නිලධාරි මහත්මියගේ අවධානයට යොමු කරන ලදී.<br><br>වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලදී.<br><br>සියළුම ගොවිසංවිධාන එකඟතාවය පළ කරන ලදී.<br><br>සියළුම ගොවිසංවිධාන එකඟතාවය පළ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | | විරෝධතාවය දැක්වීම සඳහා ගොවි සංවිධාන සහයෝගය දැක්වීය යුතු බවත් මහකනදරාව වැව් රක්ෂිතයේ ඉදිකර තිබෙන වන ජීවී දෙපාර්තමෙන්තුවට අයත් ගොඩනැගිල්ල ඉවත් කළ යුතු බවත් ඒ සම්බන්ධව ඇමතිතුමා හමුවීමට ගොවිසංවිධාන නිලධාරීන් කඩිනමින් එකතු විය යුතු බව | |
| 4.7.6 | ගරු සභාපති දකුණු ඉවුර රණමයුර ගොවි සංවිධානය | වැලි ඔය හරස් වී ඇති බැවින් වාන් දොරටු විවෘත කරන විට කුඹුරුවලට අවම හානියක් වන පරිදි කටයුතු කරන ලෙස | ඒ පිළිබඳ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේ වන විටත් අවධානය යොමු කර ඇති බව ඉංජිනේරු සහකාර මහතා පවසන ලදී . |
| 4.7.7 | ගරු සභාපති දකුණු ඉවුර සමගි ගොවි සංවිධානය | OT 22 ඇලේ ප්‍රධාන අපවහන ඇල මාර්ගය අවහිර කර ඉදිකර ඇති කොන්ක්‍රීට් බැම්ම නිසා මතුව තිබෙන ගැටළුව විසදා ගැනීමට රජයේ නිළධාරින්ගේ මැදිහත් වීම අවශ්‍ය බව | රඹෑව ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරීගේ අවධානයට යොමු කරන ලදී. |

5 සංශෝධන වූ 2019 /20 මහ වගා තීරණ

2019/20 මහ කන්නය සඳහා 2019/10/08 දින පැවැත්වූ කන්න රැස්වීම් තීරණ පරිදි 2019/11/01 දින වගාව සඳහා ජලය ලබා දිය යුතු නමුත් නිකුත් කිරීමට ප්‍රමාණවත් ජල ධාරිතාවයක් මෙතෙක් ජලාශයේ නොතිබූ බවත් අද වන විට සතුටුදායක ජල ධාරිතාවයක් ජලාශයේ පවතින බැවින් දිස්ත්‍රික් ලේකම්තුමා ව්‍යාපාර කළමනාකරණ කමිටුවට ලබා දුන් බලය අනුව අද දින කන්න රැස්වීම් තීරණ සංශෝධනය කර ගැනීම සුදුසු බවත් තීන්දු තීරණ ගැනීමේදී මුල් වර්ෂාව උපයෝගී කරගෙන පිහිටුවා තිබෙන වගාව පිළිබඳවද සැලකිල්ල යොමු කරමින් තීරණ ගැනීම සුදුසු බව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමිය පැහැදිලි කරන ලදී.

මෙහිදී ඉංජිනේරු සහකාර බුද්ධික මහතා කථා කරමින් වැසි දිය උපයෝගී කරගෙන වගාව පිහිටුවීම සුදුසු බවත් දින 10ක් තුල වපුරා අවසන් කිරීම සුදුසු බවත් පැහැදිලි කරන ලදී.

ගොවිසංවිධාන මට්ටමින් ඉදිරිපත් කරන ලද අදහස් හා යෝජනා

| ඉදිරිපත් කළ අය | කාරණය |
|---|---|
| ගරු සභපති<br>ව.ඉ සුහද ගොවිසංවිධානය | අහස් දිය උපයෝගීකරගෙන දෙසැ.15 වන විට වපුරා අවසන් කිරීම සුදුසු බව |
| ගරු සභාපති<br>ද.ඉ පැරකුම් යාය 02 | අහස් දිය උපයෝගීකරගෙන දෙසැ.15 වන විට වපුරා අවසන් කිරීම සුදුසු බව |
| ගරු භාණ්ඩාගාරික<br>දඉ සමගි ගොවිසංවිධානය | අහස් දිය උපයෝගීකරගෙන දෙසැ.15 වන විට වපුරා අවසන් කිරීම සුදුසු බව |
| ගරු සභපති<br>ද.ඉ සුහද ගොවිසංවිධානය | දෙසැ 15 ට වපුරා අවසන් කිරීම අපහසු බැවින් දෙසැ 20 දිනය සුදුසු බව පැවසු අතර<br>අනෙකුත් සියළුම ගොවිසංවිධාන එම අදහසට විරෝධතාවය පළකරන ලදී. |

ඉහත කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව 2019/10/08 දින ගනු ලැබු 2019/20 මහ කන්නයේ වගා තීරණ පහත පරිදි සංශෝධන කර ගන්නා ලදී.

1.යෝජිත වගා බිම් ප්‍රමාණය - අක්කර 6100

2.වගා කිරීමට යෝජිත භෝගය හා ප්‍රභේදය - වී මාස 03

3. වගා කිරීමට යෝජිත ප්‍රදේශය - වම් ඉවුර හා දකුණු ඉවුර ගොවිසංවිධාන බල ප්‍රදේශය තුල

4.වාරිමාර්ග දෙපාර්තමේන්තුව , ගොවි සංවිධාන හා ගොවීන් විසින් ප්‍රධාන ඇල සහ බෙදුම් ඇලවල් හා කෙත් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කලයුතු දිනය 2019/12/08

5.ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකරනු ලබන ඇලවල් ගොවි සංවිධාන විසින් ශුද්ධ කලයුතු අවසන් දිනය 2019/12/10

6.මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - 201912/25 (අවශ්‍යතාවය පරිදි.)

7.බිම් සැකසීම ආරම්භ කල යුතු දිනය - 2019/12/05 (මෙතෙක් බිම් සැකසීම ආරම් නොකල කුඹුරු)

8.වපුරා හෝ පැළ සිටුවා අවසන් කලයුතු දිනය - 2019/12/15 ට පෙර

9. මුර ජල කාලය - දින 85

10.මුර ජලය ආරම්භ වන දිනය - 2019/12/25 (අවශ්‍යතාවය පරිදි.)

11. අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - 2020/03/10

12.වගාරක්ෂණකරඅවසන් කල යුතු දිනය - 2019/12/15

13. වගා හානි දැනුම් දිය යුතු අවසන්දිනය - 2020/04/10

14. අස්වනුනෙලාඅවසන් කළ යුතු දිනය - 2020/04/10

1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතේ 11 වන වගන්තිය 1 හා 2 අනු වගන්තිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත නීති රීති

1). ගොවි සංවිධාන සංවර්ධන අරමුදල සඳහා වගා කරනු ලබන සෑම අක්කර 1ක් සඳහාම රු. 300ක මුදලක් ගොවිසංවිධානයට ගෙවිය යුතුය.
2). නියමිත දිනට ඇලවේලි ශුද්ධ නොකරන ගොවින්ගෙන් බඹයකට රු.300 කමුදලක් ගොවිසංවිධානය විසින් අය කරනු ලැබේ.
3). වාරි නිර්මිත වලට හානි කිරීමේ දඩය - වාරිමාර්ග ආඥා පනත අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

4).2019/ 11 /01 සිට 2020/ 04/15 දක්වා කාලය තුල යායට ගවයන් ඇතුළත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය

විශේෂ ව්‍යාපාර කමිටුව ලෙස අද දින ගනු ලැබූ ඉහත 2019/20 මහ වගා තීරණ ලෙසට ක්‍රියාත්මක කිරීම සුදුස බව ද.ඉ පැරකුම් යාය05 ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා යෝජනා කල අතර ව.ඉ එක්සිත් ගොවිසංවිධානයේ ගරු ලේකම් මහතා විසින් ස්ථිර කරන ලදී.

05 කෘෂිකර්ම සංවර්ධන කටයුතු - මුලස්ථාන කෘෂිකර්ම උපදේශක ඒ.ජී.එස් සුභාෂිනී මහත්මිය

5.1 2019/20 මහ කන්නය සඳහා මාස 03 කාණ්ඩයේ බීජ වී මේ වන විට නොමැති බවත් පොලොන්නරුවේ බීජ වී අලෙවි සැලේ මාස 03 බීජ වී ලබා ගත හැකි බවත් මේ වන විට කන්නය පසු වී ඇති නිසා බීජ ප්‍රතිකාර සඳහා යොමුවීම අවශ්‍ය බවත් පැල මැක්කාගේ හානිය සම්බන්ධයෙන් ගොවීන්අවධානය යොමු කල යුතු බවත්සේනා දළඹු හානිය පාලනය සඳහා පුහුණු වැඩසටහන් ක්ෂේත්‍ර නිරීක්ෂණය කර උපදෙස් ලබා දීම සිදු කරන බවත් දැනුම් දෙන ලදී.

5.2 PEISEIP ව්‍යාපෘතිය යටතේ යටතේ ලියදි විශාල කිරීම සඳහා ව.ඉ මිහිදු ගොවි සංවිධානයේ අක්කර 04ක් ද.ඉ රණමයුර ගොවි සංවිධානයේ අක්කර 05ක් ව.ඉ සුහද අක්කර 05ක් ද.ඉ සුහද අක්කර 02ක් ව.ඉ මහසෙන් අක්කර 01ක් සඳහාමේ වන විට වවුචර් පත් භාර දී ඇති බව බවත්

ලියාපදංචි බිත්තර වී බුසල් 50ක්(BG 352 ලියාපදිංචි) බීජ වී ගොවිපළ සඳහා බෙදා දී ඇති නමුත් නියමිත කාලයට වැපිරීමට නොහැකි වු නිසා පැරෂුට් වගාව සිදු කල ගොවීන්ට එම බීජ වී ලබා දුන් බවත් තවත් ලියා පදිංචි බීජ වී බුසල් 70ක් ලබා ගත හැකි බවත් මිලදී ගැනීම සඳහා මුදල් අනුමත වී ලැබෙනතෙක් ඒකාබද්ධ ගොවිසංවිධානයෙන් මේ සඳහා මුදල් ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර ඒකාබද්ධ ගොවිසංවිධානයේ එකඟතාවය එයට පළ කරන ලදී.

මේ වන විට තම ගොවි සංවිධානයේ ගොවීන් බීජ වී සපයාගෙන ඇති බැවින් තම බල පෙදෙසට ලියාපදිංචි බීජ වී අවශ්‍ය නොමැති බව ව.ඉ මිහිදු ගොවිසංවිධානයේ ගරු සභාපත මහතා පවසන ලදී.

වී වගාවේ විශේෂ යායේ ලියදි විශාල කිරීම හා ගැඹුරට බිම් සකස් කිරීම් සිදුකර ඇති ගොවිසංවිධානයන්හි වවුචර් පත් ඉදිරිපත් කර ඇති බවත් 50% දායකත්වය යටතේ පැරෂුට් තැටි 2400ක් ලැබී ඇති බවත්

06 යෙදවුම් හා සේවා සැපයීම් කටයුතු සංවර්ධන නිලධාරී - ජේ.කේ.එන්.එස් පෙරේරා මිය

6.1 මේ වන විට පොහොර සහනාධාරය ක්‍රියාත්මක බවත්

6.2 PEISEIP ව්‍යාපෘතිය යටතේ වම් ඉවුර මිහිදු ගොවි සංවිධානයට පමණක් මේ වන විට කමත් ඉදිකිරීම සඳහා මුදල් ලැබි ඇති බවත් පවතින වර්ෂාපතනය යටතේ එහි ඉදි කිරීම් කටයුතු සිදු කිරීමේ අපහසුතාවයක් පවතින බවත් දැනුම් දෙන ලදී.

ව.ඉ මහසෙන් ගොවිසංවිධානයේ ගරු සභාපති මහතා කථා කරමින් PEISEIP ව්‍යාපෘතිය යටතේ පොදු කමත සඳහා යෝජනා ඉදිරිපත් වුවත් ඒ සඳහා පොදු ඉඩමක් තම ගොවිසංවිධාන බල ප්‍රදේශයේ සොයාගත නොහැකි වු බැවින් කමත වෙනුවට ගොවිපල සංවර්ධන සංරචකය යටතේ යෝජනා වී ඇති කමත් අතුරන හා තරාදි.02.ක් ලබා දෙන ලෙසට ඉල්ලීමක් කළ අතර ඒ පිළිබඳව රඹෑව ගොවිජන සංවර්ධන ප්‍රදේශීය නිළධාරි මහත්මියගේ අවධානයට යොමු කරන ලදී.

ද.ඉ පැරකුම්යාය05 ගොවිසංවිධානයේ ගරු සභාපති මහතා කථා කරමින් PEISEIP ව්‍යාපෘතිය යටතේ වගා ලිං ක්‍රියාත්මක නොවීම නිසා කමත විශාල කිරීමට කරන ලද යෝජනාව පිළිබඳව ප්‍රගතිය විමසන ලදී. ඒ සඳහා යෝජනාව ඉදිරිපත් කළ බව ගොවිජන සංවර්ධන ප්‍රදේශීය නිළධාරි මහත්මිය දැනුම් දෙන ලදී.

7. ඉඩම් සංවර්ධන කටයුතු -

7.1 රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජනපද නිලධාරී කේ.ජී.ආර්.කේ විතානගේ මහත්මිය කතා කරමින් මහකනදරාව ව්‍යාපාරයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩම් සම්බන්ධව නොවැම්බර් මාසයේද 2019ජනාධිපති වරණය හේතුවෙන් විශේෂ රාජකාරියක් සිදු නොකල බවත්

7.2 ඉකිරිගොල්ලෑව 102 ග්‍රාම නිලධාරී වසමේ සකස් කරන ලද දීමනාපත්‍ර 03ක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා දීඇති බවත්
එම දීමනා පත්‍ර 03 සඳහා සේවා ගාස්තු ගෙවීමෙන් අනතුරුව ලියා පදිංචි කිරීමෙන් පසු අදාල පුද්ගලයන් හට ලබා දිය හැකි බවත් ඉදිරියේදී නව ඉඩම් කච්චේරි තැබීමට බලා පොරොත්තු වන බවත් අළුත්වැව රක්ෂිත සීමාව වෙන් කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන බවත් පවසන ලදී.

7.3 මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජනපද නිලධාරී සී. එම් රත්මැනිකේ මහත්මිය කථා කරමින් 2019 වාර්ෂික දීමනා පත්‍ර ප්‍රගතිය 35ක් මේ වන විට සකස් කර අවසන් බවත් දීර්ඝකාලීන බදු බල පත්‍ර 18ක් සකස් කර ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත යවා ඇති බවත් ව.ඉ රණමයුර ගොවිසංවිධානයේ OT7 ඇලේ වැසී තිබූ එම කුණු ඇල රජයේ මිනින්දෝරු මහතුන්ගේ මැදිහත් වීමකින් කුණු ඇල සකස් කිරීම සඳහා සහය ලබා දුන් බවත්

ව.ඉ එකමුතු ගොවි සංවිධානයට පොහොර ගබඩාවක් සහ වී වේලා ගැනීමේ කමතක් ඉදි කර ගැනීමට අවශ්‍ය ඉඩම සඳහා අනු රේඛන වාර්තා කාර්යාලයට ලබා දුන් බවත් දැනුම් දෙන ලදී.

8. සත්ව සංවර්ධන කටයුතු

8.1 මිහින්තලය පශු වෛද්‍ය කාර්යාලය නියෝජනය කරමින් සත්ව සංවර්ධන උපදේශක නිරන්ජන් සිල්වා මහතා කථා කරමින් පවතින කාලගුණය යටතේ එළ, මී ගවයින්ට සහ එළුවන්ට පණු රෝග ඇති වීම බහුලව සිදුවන අතර සතුන්ගේ වෙනසක් දුටුවිට හැකි ඉක්මනින් පශු වෛද්‍ය කාර්යාලය මිහින්තලේ 02522666563 දුරකතන අංකයට දන්වන ලෙසත් ගවයින්ට කුර මුඛ රෝගය වෙනත් ප්‍රදේශවල නැවත

ව්‍යාප්ත වන බව දැක ගන්නට ඇති බවත් මේ ගැන දැනගත් වහාම ළගම පශු වෛද්‍ය නිලධාරීන්ට දක්වන ලෙසත් පවසන ලදී.න

8.2 රඹෑව පශු වෛද්‍ය කාර්යාලය නියෝජනය කරමින්සත්ව සංවර්ධන උපදේශක එස්.එස් සී ඩී කුමාරි මිය කතා කරමින් වර්ෂා කාලයත් සමඟ සතුන්ට ආහාර ලබා ගැනීමට තිබූ තෘණ භූමි භාවිතයට අපහසු බැවින් රඹෑව බල පෙදෙසට තෘණ භූමියක අවශ්‍යතාවය පවතින බවත්ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් පවසන ලදී.

ඉහත කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ප.ව. 1.30 ට පමණ නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමියගේ ස්තුති කථාවෙන් පසු රැස්වීමේ කටයුතු අවසන් කෙරිනි.

මීලඟ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම 2020 ජනවාරි 02 දින පැවැත්වේ.

........................
I.D.N.I. පතිරණ
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මහකනදරාව ව්‍යාපාරය
රඹෑව.

<u>පිටපත්</u>

- ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය,කොළඹ - කා. දැ.ගැ.ස
- අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමණාකරණ අංශය,කොළඹ - කා. දැ.ගැ.ස
- දිස්ත්‍රික් ලේකම්,අනුරාධපුර - කා. දැ.ගැ.ස
- වැඩසටහන්අධ්‍යක්ෂ,PEISEIP ව්‍යාපෘතිය -කා. දැ.ගැ.ස
- නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,PEISEIP ව්‍යාපෘතිය -කා. දැ.ගැ.ස
- වාරිමාර්ග අධ්‍යක්ෂ,අනුරාධපුර - කා. දැ.ගැ.ස
- අධ්‍යක්ෂ, ජල කළමණාකරණ අංශය වාරිමාර්ග දෙපාර්තමේන්තුව,කොළඹ - කා. දැ.ගැ.ස
- නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ/ප),අනුරාධපුර -කා. දැ.ගැ.ස
- ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්,අනුරාධපුර - කා. දැ.ගැ.ස
- ප්‍රාදේශීය ලේකම් රඹෑව/මිහින්තලය - කා. දැ.ගැ.ස
- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු,අනුරාධපුර - කා. දැ.ගැ.ස